**IPRC/16/222**

# මහාසමයසූත්‍ර වර්ණනාවෙහි අන්තර්ගත නිර්විශේෂාර්ථ බහුරූපී පාඨ: සිංහල, ඉංග්‍රීසි හා බුරුම ත්‍රිපිටක සංස්කරණ ආශ්‍රයෙන් සිදුවන ශාස්ත්‍රීය අධ්‍යයනයක්.

ලෙල්ලාවල අරියදම්ම හිමි[1]*

දීඝනිකායේ මහාවග්ගයෙහි සංගෘහීත මහාසමය සූත්‍රය, ඓතිහාසික වටිනාකමකින් යුක්ත, ශාස්ත්‍රීය අධ්‍යයනයන්හි දී ප්‍රාථමික මූලාශ්‍රයයක් වශයෙන් සම්භාවිත, එසේ ම විවාදාපන්න මතවාදවලට ප්‍රස්තුත වන සූත්‍රයකි. ථේරවාදී සාම්ප්‍රදායික පිළිගැනීම මහාසමය බුද්ධභාෂිතයක් වශයෙන් වුවත්, දේවභාෂිත සම්බුද්ධානුඥාත සූත්‍ර පර්‍යායයක් වශයෙන් ද (අබේනායක, 2009, 152 - 153 පිටු.) කිසියම් මහායානික ආචාර්‍යවරයෙකු විසින් සංස්කෘත භාෂාවෙන් රචනා කරන ලදුව මාගධී භාෂාවට පරිවර්තිත ව නිකාය ග්‍රන්ථාන්තර්ගතයට සංගෘහීත වූවක් වශයෙන් ද (බුද්ධදත්ත, 2010, 32 පිටුව) විද්වතුන් විසින් හඳුනා ගනු ලැබ ඇත. සංස්කෘත ආභාසය සහිත සූත්‍රයක් වීම, වෛදික බලපෑම තුළින් අන්තර්ගතයට එක් වූ දේවනාමාවලියකින් සමන්විතවීම, උපයුක්ත භාෂා ශෛලීය විවිධතා ආදී සහේතුක කරුණු යථෝක්ත හඳුනා ගැනීම්වලට හේතු වී ඇතැයි සිතිය හැකි ය. මහාසමය සූත්‍රයෙහි අර්ථවර්ණනාව සුමඞ්ගලවිලාසිනී දීඝනිකායට්ඨකථාවෙහි ‘මහාසමයසුත්තවණ්ණනා’ නමින් අන්තර්ගත වේ. සූත්‍රාර්ථ විවරණ සැපයීම් විෂයයෙහි ක්‍රියා කළ අට්ඨකථාචාර්යයන් වහන්සේ හමුවෙහි ද මෙම ගැටලු ඉස්මතු වී තිබුණු බවට සාධක තච්ඡූත්‍ර වර්ණනාවෙන් ම පිළිබිඹු වේ. පාලි අට්ඨකථාකරණයේ දී ත්‍රිපිටකයෙහි ඓතිහාසිකත්වය, ස්වාධීනත්වය හා ප්‍රාමාණිකත්වය සුරක්ෂිත කිරීම ථේරවාදී සම්ප්‍රදායයේ ප්‍රමුඛ කාර්යයක් වූ බැවින් මහාසමය සම්බන්ධයෙන් වූ යථෝක්ත ගැටලු නිරාකරණය, අසීරු කරුණක් වන්නට ඇත. මහාසමයසූත්‍රයෙහි විවිධ සමයාන්තර පද පාඨ භාවිත වී තිබීම, සංස්කෘත භාෂා ආභාසය, වෛදික දේවනාම මහාසමයට ඇතුළත් ව තිබීම අර්ථකථන සංකීර්ණතා මතු වීමට බලපා ඇති බව පෙනේ. මේ ගැටලු අවම කිරීම් වශයෙන් පාලි අට්ඨකථා අනුගමනය කොට ඇති එක් ක්‍රමවේදයක් වන්නේ නිර්විශේෂාර්ථ බහුරූපී පද පාඨ භාවිතයයි. විශේෂයෙන් ම දේවනාමයන් සඳහා විවරණ සැපයීමේ දී සංස්කෘත භාෂාවට, වෛදික දේවනාමයන්ට, නිකායාන්තරික පද පාඨ හඳුනා ගැනීම්වලට අනුගත ව මෙන් ම පාලි ක්‍රමයට ද අනුරූපී ව සාමාන්‍යාර්ථ බහුවිධ පද පාඨ මහාසමය සූත්‍ර වර්ණනාවෙහි භාවිත කොට ඇත. එහි ඇතැම් දේවනාමයන්ට “ජනෙසභො’ති ජනවසභො දෙවපුත්තො” යනුවෙන් ඍජු අනන්‍යතා ද ඉදිරිපත් කොට ඇත. එසේ ම ඇතැම්විට “පාලියම්පන කට්ඨකා චාති ලිඛන්ති” යනාදී වශයෙන් පාලි ක්‍රමය ද යෝජනා කොට ඇත. මෙසේ සුමඞ්ගලවිලාසිනී දීඝනිකායට්ඨකථාවේ මහාසමය සූත්‍ර වර්ණනාවෙහි විද්‍යමාන වන නිර්විශේෂාර්ථ බහුරූපී පද පාඨ භාවිතය, ශාස්ත්‍රීය අධ්‍යයනයක් මගින් ගවේෂණය කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ ප්‍රමුඛ අපේක්ෂාවයි.

***ප්‍රමුඛ පද*** *: මහාබලා, වෙටෙණ්ඩු, කට්ඨකා, ජාතිනාමා, ජනෙසභො, චිත්තසෙනො.*

[1] පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය * ven.ariyadhamma@yahoo.com